# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1654/3 - 2010 මැයි 18 වැනි අඟහරුවාදා - 2010.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

නැගෙනහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුව පිරවීම

නැගෙනහිර පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (1) වැනි වගන්තිය යටතේ නැගෙනහිර පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජනතා නිදහස් සන්ධානය පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස නිමල් ගාමිනී හේවාවිතාරණ මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, නිමල් ගාමිනී හේවාවිතාරණ මහතා එම පුරප්පාඩුව සිදු වූ ත්‍රිකුණාමලය පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත් වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 ක් වූ මැයි මස 15 වැනි දින,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
රාජගිරිය.

06 - 08

1A - G 12856— 370 (2010/05)

## 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත

### සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුව පිරවීම

සබරගමුව පළාතේ පළාත් සභාවේ මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස තේරී පත්වීම හේතුකොට ගෙන එම පළාත් සභාවේ මන්ත්‍රී ධූරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (1) වැනි වගන්තිය යටතේ සබරගමුව පළාතේ පළාත් සභාවේ ලේකම්වරයා විසින් මා වෙත දන්වා තිබෙන හෙයින් ද,

එකී පුරප්පාඩුව පුරවනු පිණිස තෝරා පත්කර ගත් මන්ත්‍රීවරයා අයත්ව සිටි පිළිගත් දේශපාලන පක්ෂය වන එක්සත් ජනතා නිදහස් සන්ධානය පක්ෂයේ ලේකම්වරයාට ඉහත කී පනතේ 65 (2) වැනි වගන්තිය යටතේ සුදුසුකම් ඇති තැනැත්තෙකු නාමයෝජනා කරන ලෙස ම විසින් නියම කර ඇති හෙයින් ද,

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්වරයා විසින් එකී පුරප්පාඩුව පුරවනු පිණිස යූ. කේ. ආර්. අබේරත්න මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද,

මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක වන මම, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනතේ 65 (2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින්, යූ. කේ. ආර්. අබේරත්න මහතා, එම පුරප්පාඩුව සිදු වූ කෑගල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ ඉහත සඳහන් පළාත් සභාවේ මන්ත්‍රීවරයා ලෙස තේරී පත් වී ඇති බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

දයානන්ද දිශානායක,
මැතිවරණ කොමසාරිස්.

2010 ක් වූ මැයි මස 17 වැනි දින,
මැතිවරණ මහ ලේකම් කාර්යාලය,
රාජගිරිය.

06 - 09

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.